**දශක තුනක් තිස්සේ උතුරේ පැවැති යුද්ධයේ අවසාන දින කිහිපය තුළදී රජයේ හමුදාවන්ට බාරවූ එල්.ටී.ටී.ඊ. ඉදිරි පෙළ සාමාජිකයන් අතර එම සංවිධානයේ දේශපාලන අංශයේ කාන්තා නායිකාව තමිළිනී ජෙයක්කුමාරන් ද විය. යුද ජයග්‍රහණයෙන් පසුව රජය ක්‍රියාත්මක කළ පුනරුත්ථාපන වැඩ පිළිවෙළ යටතේ නැවත සමාජ ගත කෙරුණු ඇය ඉන් වසර කිහිපයකට පසුව මහරගම පිළිකා රෝහලේදී ජීවිතක්ෂයට පත්වූයේ පිළිකා රෝගියෙකුවය. පිළිකා රෝගයට ගොදුරුව මරණය අභිමුව සිටියදී ඇය එල්.ටී.ටී.ඊ. සංවිධානය හා සම්බන්ධ සිය ක්‍රියාකාරකම් සහ බිහිසුණු අත්දැකීම් පිළිබඳ තබන ලද ලිඛිත සටහන් පසුව දෙමළ භාෂාවෙන් පොතක් ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. එහි ඇතුළත් කරුණු දෙමළ සමාජය තුළ මහත් විවාදයටද, බාහිර සමාජයේ මහත් අවධානයටද ලක්විය.**

**අතිමහත් සමාජ පිරිවැයක් දරමින් එල්.ටී.ටී.ඊ. යුද සංවිධානය වැනසීමට රජයේ හමුදා සමත් වුවද, එම සංවිධානයේ නැඟීමට සහ පැවැත්මට බලපෑ හේතු නැසීමට රජය මෙතෙක් සමත්වී නැත. උතුරේ දෙමළ ජාතිවාදයද, නැඟෙනහිර මුස්ලිම් ජාතිවාදයද, දකුණේ සිංහල ජාතිවාදයද මේ මොහොතේ නව වටයකින් හිස ඔසවමින් සාමකාමී පුරවැසි සමාජයට සන්නිවේදනය කරන පනිවිඩයද බෙහෙවින් භයානකය. එවැනි පසුබිමක මද අස්වැසිල්ලක් භුක්තිවිඳිමින් සිටින දැනුම්වත් සිංහල පුරවැසි සමාජයට තමිළිනීගේ මරණාසන්න ස්මරණය මගින් ලබාදෙන පනිවිඩයේ ඇති සුවිශේෂීත්වය සළකා එහි සිංහල පරිවර්තනය කොටස් වශයෙන් ඔබ වෙත ගෙනඑන්නෙමු.**

**තමිළිනී දෙමළ බසින් තැබූ සටහන් සිංහලයට නැඟූ ආචාර්ය ස්වාමිනාදන් විමල් සහ ඒ සඳහා අවශ්‍ය සෙසු සම්පත්දායකත්වය සැපයූ සිනමාවේදී ධර්මසිරි බණ්ඩාරනායක දෙපළට මෙහිදී අපගේ විශේෂ ස්තූතිය පිරිනමමු.**

සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න



## තමිළිනීගේ කතාව 17

# 'රට වෙනුවෙන් සටන් කළ අපේ දරුවන්'ගේ ඉරණම

දෙදහස් හතර වසරේ අවසානයේ ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ පීඩාවට පත් කළ සුනාමි ආපදාවේදී උතුරු නැගෙනහිර බොහෝ මුහුදුබඩ ගම් සම්පූර්ණයෙන්ම විනාශයට පත්වීය. මෙම ස්වාභාවික ආපදාව සිදුවූ මොහොතේ මම මන්නාරම නගරය අසළ වූ කඳවුරේ දේශපාලන වැඩසටහන් සඳහා නතරව උන්නෙමි. සුනාමියෙන් තුවාල ලැබූ අති විශාල ජනකායකට ඉතාමත් හදිසියෙන් ලේ අවශ්‍යව ඇති බවත් ඒ සඳහා කටයුතු සිදුකර වහාම ලේ ලබාගෙන එම ලේ මුලතිව්වලට යවන ලෙසත් නායකත්ව මණ්ඩලයෙන් මට දැනුම් දුන්නේය.

වහාම කිලිනොච්චියට පැමිණෙන ලෙස මට දැනුම් දුන් හෙයින් මම වහාම එහි ගියෙමි. දේශපාලන අංශයට අයත් කිසිම කඳවුරක එකම සටන්කාමියෙකුවත් සිටියේ නැත. සියලු දෙනාම වඩමාරච්චි නැගෙනහිර සිට මුලතිව් දක්වා වූ සුනාමියෙන් පීඩාවට පත් මුහුදු බඩ පළාත්වල ජනතාව වෙනුවෙන් ක්ෂණික සහන සහ මුදාගැනීමේ කටයුතුවල යෙදී උන්හ. මෙම වැඩකටයුතු සංවිධානය කරන හදිසි රැස්වීමක් සඳහා දේශපාලන අංශයේ භාරකරු තමිල් චෙල්වන් මාවද කැඳවා ගෙන ගියේය. තුවාල වූ අය බේරාගැනීමත්, මියගිය අයගේ සිරුරු රැස් කිරීමත් යන කටයුතු දිගටම සිදුවෙමින් තිබිණ. මුදාගත්තවුන් සඳහා නැවතීම් පහසුකම් වෙනුවෙන් පාසල් ගොඩනැගිලි පිළියෙළ කළේය. පිසූ ආහාර, ළදරු කිරිපිටි යනාදියත්, ක්ෂණික අවශ්‍යතාවන්ව පැවති භාණ්ඩත් බෙදා දෙමින් තිබිණ. කොටි සංවිධානයෙහි සියලුම බළඇණි ජනතාව සමඟ එක්ව ඉතාමත් වේගවත්ව කටයුතු කරන්නට වූහ.

මා සහභාගි විය යුතු රැස්වීමක් ඉයක්කච්චි හන්දියෙහි සංවිධානය කර තිබුණි. ඒ වන විට සටන් විරාම ගිවිසුම ක්‍රියාත්මකව පැවැති හෙයින් වන්නි ප්‍රදේශයෙහි සේවය කරමින් සිටි බොහෝ රාජ්‍ය නොවන සංවිධානවලට අයත් පිරිසක්ද ප්‍රදේශයේ ජනතා නියෝජිතයෝද සංවිධානයෙහි දේශපාලන අංශය භාර අයද පූජකවරුද ඒ නමය ප්‍රධාන මාර්ගයට ආසන්නයෙහි ගසක් යට රැස්ව වුන්හ. තමිල් චෙල්වන් අදාළ පිරිස්වලින් තමා අයත් සංවිධානය මගින් කළ හැකි ක්‍රියාමාර්ග මොනවාදැයි විමසුවේය. ජනතාවට ඉතාමත් ඉක්මනින් සහනාධාර ලබාදිය යුතුව තිබියදී සමහර රාජ්‍ය නොවන සංවිධාන තම සුපුරුදු ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතු බවත්, ඒ අනුව කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයට සැලැස්ම යවා ඔවුන්ගේ නිර්දේශ මත ක්‍රියාකළ හැකි බවත් පැවසීය. එය දේශපාලන අංශයෙහි භාරකරු තුළ මහත් කෝපයක් ඇති කිරීමට හේතු වීය. විශාල ස්වාභාවික ආපදාවක් සිදුව ඇති තත්ත්වයක දී හදිසි අත්‍යවශ්‍ය කටයුතු වහාම සිදුකළ හැකි ආයතන පමණක් අද සිට ක්‍රියාත්මක විය හැකිය. ඒ හැර සුපුරුදු න්‍යාය පත්‍රයට අනුව පමණක් ක්‍රියාකළ හැකි සංවිධාන පිටව යෑම වඩාත් සුදුසුය. යැයි තමිල් චෙල්වන් ප්‍රකාශ කළේය. එය බොහෝ රාජ්‍ය නොවන සංවිධානවලට මහත් ගැටළුකාරී තත්ත්වයක් ඇති කළේය. එහෙයින් බොහෝ සංවිධාන තමනට වහාම සිදුකළ හැකි වැඩසටහන් පිළිබඳව විස්තර කරන්නට වීය. එහි ක්‍රියාත්මක වූ සියලුම රාජ්‍ය නොවන සංවිධාන එක් රැස්ව දෙමළ පුනරුත්ථාපන සංවිධානයට අයත් සැළසුම් ක්‍රියාත්මක කිරීමට තීරණය කළෝය.

කාන්තාවන් සහ ළමුන් සඳහා වන මූලික අවශ්‍යතා ඉටු කිරීමට ජනයාගේ තාවකාලික රැඳවුම් ස්ථානවල සටන්කාමී සහෝදරියන් සමඟ ස්වෙච්ඡා කාන්තාවෝද කටයුතු කළහ. මුලතිව් ප්‍රදේශයෙහි ජනයා උදෙසා මෙවැනි කටයුතු සංවිධානය කිරීමේ රැස්වීමක් මුල්ලියවලෙ ප්‍රදේශයෙහිදී පැවැත්වීය. සියලුම රැස්වීම් අවසන්වී කිලිනොච්චියට පැමිණෙන තෙක් මාහට පුද්ගලිකව කළ යුතු කිසිම කාර්යයක් පැවරුවේ නැති හෙයින් පසු දින ජනතා රැස්වීම්වලට ගොස් අනෙකුත් සටන්කාමීන් සමඟ එක්ව එම කටයුතුවල යෙදීමට මම තීරණය කළෙමි.
මා කිලිනොච්චිය සාම ලේකම් කාර්යාලයට පැමිණි අවස්ථාවේ මඩකලපුව අම්පාර දිස්ත්‍රික්කවල දේශපාලන අංශ භාරකරුවන්ගේ කිසිම තොරතුරක් නොලද බවත්, ඔවුන් සමඟ සම්බන්ධතාව ගොඩ නඟා ගත නොහැකිව පවතින බවත් දැන ගන්නට ලැබිණ. එම ස්ථානයනට වහාම යාමේ දැඩි අවශ්‍යතාව මතු වූයෙන් තමිල් චෙල්වන් එම වගකීම මා වෙත පැවරුවේය.

'තමිළිනී ඔයා වහාම අම්පාරට යන්ඩ. සුනාමියත් එක්ක දිගටම වැස්සලු. යාපනේ ඉදන් සහනාධාර ලොරි 25ක් ඇවිත් තියනවා. ඒවාත් අරගෙනයි යන්න ඕනෑ. ඔයාට පුළුවන්ද? මගේ හිත එක තප්පරයක් පමා වුණේ නැත. 'ඔව් මට යන්න පුළුවන් මම යන්නම්.'

සටන් විරාම කාලය තුළ මෙයට පෙර කීප වතාවක් දේශපාලන කටයුතු සඳහා නැඟෙනහිර පළාතට ගිය අත්දැකීම් මා සතුව තිබිණ. මම පළමු සහ දෙවන වතාවේ ගිය විට එවක කොටි සංවිධානයේ නායකයෙකු වූ කරුණා අම්මාන්ව මුණ ගැසුණෙමි.

නැඟෙනහිර දී අප සංවිධානය කළ කාන්තා සමුළුවටත් ඔහු බොහෝ උපකාර කළේය. කොටි සංවිධානය බෙදුණු පසුව නැඟෙනහිර පළාතේ සටන්කාමීන් ගලවා ගැනීමේ නාමයෙන් සහෝදර යුද්ධයක කොටින්ගේ ප්‍රහාරක බළඇණියේ සටන්කාමීන්ව යොදවා තිබුණි. එයට පසුව නැඟෙනහිර පළාතේ ජනතාව හමුවීමට විශේෂිත ප්‍රචාරක බළකායක් ලෙස දේශපාලන අංශයට අයත් සටන්කාමී පිරිසක් යැවූ අතර, මමද තවත් සහෝදර සටන්කාමී සහෝදරියන් කිහිප දෙනෙකු සමඟ එහි ගියෙමි. පලුකාමම්, කලුවන්කේනි, කොක්අඩිචෝලෙ , තාණ්ඩියඩි, මගිලඩිතිවු, වාකරෙ, කදිරවේලි ඇතුළු බොහෝ ප්‍රදේශවල ගෙයින් ගෙට ගොස් ජනතාව හමුවූ සිද්ධීන් මගේ ජීවිතයෙහි අමතක නොවන අත්දැකීම්ය. හදවතේ කොතරම් දුක් වේදනා පැවැතියත් ගෙයි එළිපත්තට පැමිණි අපව 'එන්න දුවේ ඇතුළට, කන්න දුවේ, මහන්සි වෙලානේ ඉන්නේ, වතුර පොදක් හරි බීලා යන්න දුවේ' යැයි ඔවුන්ගේ ස්නේහවන්ත බව ලොවේ කිසිවකට සමකළ නොහැකිය. ස්වාභාවික සෞන්දර්යය පිරි එම භූමිය සේම ජනතාවගේ හදවත්වල ද වාමි බවත් ස්නේහවන්ත බවත් පිරී තිබිණි.



**36 වන පිටට**

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com